# වාරි පුරාවිද්‍යාවේ ඉතිහාසය විකාශනය හා තාක්ෂණය පිළිබඳ අධ්‍යනයක්

ජේ.ජේ.එච්. කිරිමැටියාව

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
Jayalankajayawardhana1999@gmail.com

**මුඛ්‍ය පද** - වැව්, අමුණ, තිරස් ජාලගත වැව්, සොරොව්ව

## හැඳින්වීම

පුරාවිද්‍යා විෂය හා අනුබන්ධව පවතින විෂයක් ලෙස වාරි පුරාවිද්‍යාව හඳුන්වා දිය හැක. එසේ ම "වාරි පුරාවිද්‍යාව" තුළින් වාරි කර්මාන්ත ආශ්‍රිතව එහි ඉතිහාසය විකාශනය හා තාක්ෂණය යන කොටස් අනුබද්ධව ද ගොඩනැගුණු ආකාරය පිළිබඳව ඉතාමත් වැදගත් හා සංකීර්ණ අයුරින් විශ්ලේෂණය කරයි. ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්ත ඉතා ඈත කාලවකවානුවක සිට ආරම්භ වී වර්තමානය තෙක් පැවත ආවකි. වාරිකර්මාන්තය ආශ්‍රිතව ගොඩනැගුණු මෙම වාරි පුරාවිද්‍යාව තුළින් රටේ බොහෝ ක්ෂේත්‍රයන් සඳහා මෙය ප්‍රයෝජනවත් වූ බව කිවහැකි ය. එමෙන් ම ඒ ආශ්‍රිතව ගොඩනැගුණු විශ්වාසයන් හා විවිධ ක්ෂේත්‍රයන් හරහා ගොඩනැගුණු සංස්කෘතියක් ද අපට උරුම විය. මෙහිදී ශිල්ප ශ්‍රේණි බොහෝමයක් ද දායාද වූ අතර, විවිධ ඇදහිලි, ආගමික උත්සව, පුද සිරිත් ආදිය ද මෙහිදී සමාජානුයෝජනය වීමෙන් වර්තමානය තුළ ද දැකගත හැකි ය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටළුව වශයෙන් ගෙන ඇත්තේ වාරි පුරාවිද්‍යාවේ ඉතිහාසය විකාශනය හා තාක්ෂණය කෙබඳු ආකාරයක් ගත්තේ දැයි සොයා බැලීමයි.

## ක්‍රමවේදය

මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යනයක් හා ක්ෂේත්‍ර නොවන ක්‍රමවේදයන් (ග්‍රන්ථ හා වීඩියෝ පට) භාවිත කළ අතර, පුද්ගල සම්මුඛ සාකච්ඡා හා විද්‍යුත් මාධ්‍යය මගින් ඉදිරිපත් කරනු ලබන වාර්තාමය වැඩසටහන් මගින් ද දත්ත එක්රැස් කරගැනීම සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වාරි මාර්ග පිළිබඳව මිනිසාගේ සිත් තුළ අවශ්‍යතාවය ගොඩනැගෙන්නට ඇත්තේ ද සත්ත්ව හා ශාක ගෘහස්ථකරණය සමග විය යුතුය. එමෙන් ම ශාක හා සත්ත්ව ගෘහස්ථකරණය හා ආහාර සඳහා බෝග වර්ග වගා කිරීමට ද සතුන්ට හා දෛනික පරිභෝජන අවශ්‍යතාවය මෙම වාරි හෙවත් ජලය යන ප්‍රධාන සාධකය පිළිබඳව සිත් යොමුකර කටයුතු කරන්නට ඇත. පුරාණ ජනයා ගංගා ආශ්‍රිතව පදිංචි වීමෙන් එය අනුමාන කළ හැකිය. එමෙන් ම පුරාණ මිනිසා දිය පහරවල් ආශ්‍රිතව තම ජීවිකාව ගෙවාගෙන ගිය අතර ම, ඉන් අනතුරුව ක්‍රමයෙන් ගංගා ආශ්‍රිතයෙන් ඔවුන් ක්‍රමයෙන් සංක්‍රමණය වීමත්, එතැන් පටන් ක්‍රමිකව ජනාවාස ඉදිවීමත් දැකිය හැකි වේ. එමෙන් ම කාලීන අයුරින් එවන් ක්‍රියාදාමයකට ගොඩනැගෙමින් පවතින සමාජය "ගමයි පන්සලයි වැවයි දාගැබයි'' යන සංකල්පය ඔස්සේ ද ගොඩනැගුණි. එමෙන් ම ක්‍රමිකව සාමාජීය, ආර්ථික, දේශපාලනික, ආගමික, සංස්කෘතිය යන සාධක ද මේ අනුව ක්‍රමිකව වර්ධනය වූ බවටද කිව හැකි වේ.

එමෙන් ම ඉන්දියාවේ ඉන්දු ගංගා තැනිතලාව ආශ්‍රිත ව හා වත්මන් පාකිස්ථානයට අයත් පංජාබ් ප්‍රදේශය, චීන නයිල් නිම්නය, මිසරය බැබිලෝනියානු ශිෂ්ටාචාරය දෙස බලන විට එය එසේ වන්නට ද ඇතැයි යන්න අනුමාන කළ හැකි ය. තවද ලංකාවේ මල්වතු ඔය, යාන් ඔය, මහවැලි ගඟ, මැණික් ගඟ, ගල් ඔය, කැලණි ගඟ, කලා ඔය, මා ඔය, දැදුරු ඔය ආදී වූ ජලප්‍රවාහ මෙහි දී පදිංචිය සඳහා තෝරා ගැනීම මෙය ද කදිම නිදසුන් වේ. තවද රට අභ්‍යන්තරයේ පවතින සානු හා තැනිතලා ආශ්‍රිත ජලාශ ඉදිකිරීම ලංකාවේ මෙන් ම, මධ්‍ය ඉන්දියාවේ හා දකුණු ඉන්දියාවේ ද අතීතයේ පටන් ම සිදුවේ. එමෙන්ම ඉන්දියානු බලපෑම මත ලංකාවේ විජය රජු දවස ද "පඬාවැව" නිර්මාණය කරවූ බව ද, වී වගා කළ බව ද

වංසකතා සාධකයෝ ගෙනහැර දක්වා ඇත. පණ්ඩුකුමරාට පාලි කුමරිය හමුවී ඇත්තේ ද ඇගේ පියා කෙතක් අස්වැද්දමින් සිටින විට කෙතට ආහාර ගෙන යන අවස්ථාවේ දී බව වංශකථාවල ද දැක්වේ. එමෙන් ම අනුරාධපුර රාජධානිය ඉදිකළ පණ්ඩුකාභය "පඬාවැව, ජයවැව, අභයවැව" ආදී වු වැව් ත්‍රිත්වයක් ඉදිකර ඇත. මේවා ඉදිකර ඇත්තේ අනුරාධපුර නගරයට ජලය ලබා ගැනීම පිණිෂ ය. මෙම වාරි කර්මාන්තය පිළිසකර කර ඇත්තේ වගාවන් සදහා ය. එමෙන්ම "සුළු, මධ්‍ය, මහා" පරිමාණයන් ඇසුරින් ද වර්ධනයට පත්විය. මිනිස් අවශ්‍යතා සදහා වාරි කර්මාන්තයන්වල වර්ධනය සනිහිටුවන් විය. මෙම යුගයෙන් පසුව, දුටුගැමුණු රජුගේ සමය වන විට "තිසාවැව" විශාල කර ඉදිකර ඇත. සීගිරිය මඟුල් උයන, අභයගිරි විහාර සංකීර්ණය, මහා විහාර සංකීර්ණය යන භික්ෂුන්ගේ වාසස්ථාන සඳහා ද ක්‍රියාත්මක වූ ජලප්‍රවාහ රටා පුරාණ මිනිසා විසින් නිර්මාණය කර ඇත (අපේ වැව,2021).

ප්‍රධාන මාවත් හරහා හා සමාන්තරව දිවෙන ඇළ මාර්ගයන්හි ජලය සොරොව්වක මාර්ගයෙන් කෙත් ඇළ මාර්ග ඔස්සේ හා සෙසු ඇළ මාර්ගයන් ඔස්සේ පොකුණු කරා ගෙන ගිය බවට සාධකය ලැබේ. අනුරාධපුර වෙස්සගිරිය, මඟුල් උයන ඉසුරුමුණිය, අභයගිරිය මහා විහාරය යන ආයතනවලට භූගතව කලුගල් ඇතිරූ ජලමාර්ග ඔස්සේ  ජලය ගෙනගිය බවට සාධක ඇත. මඟුල් උයනේ පොකුණු තුළින් දියකෙළි කිරීම සඳහා තිසා වැවෙන් ජලය උමං ජල මාර්ග ඔස්සේ ඉසුරුමුණියට අයත් පොකුණු දක්වා ම ගෙන්වාගත් බවට සාධක ඇත. සීගිරි පර්වතය මුදුනට ද ජලය සපයා ගෙන ඇති අතර සීගිරි ජලමල් නිර්මාණය මගින් වාරි තාක්ෂණයෙහි දියුණුව මනාව දැක්වේ. අනුරාධපුර අභයගිරි භූමියට අයත් ඇත් පොකුණට ජලය සපයා ගෙන ඇත්තේ ද, බසවක්කුලම වැවෙනි. එයට සැපයූ ජලය අභයගිරි විහාරයේ වැඩ විසූ භික්ෂූන්ගේ පැන් පහසුව සඳහා යොදාගෙන ඇත. එමෙන්ම වාරි කර්මාන්තයන්ට ජලය සපයාගත් ස්ථාන බොහෝ ය. වැසි අවස්ථාවලදී නගරයේ ගොඩනැඟිලිවලින් පතිතවන්නා වූ ජලය කාණු පද්ධතියක් හරහා මෙම පොකුණුවලට යොදාගෙන ඇත. එමෙන්ම මෙයට අමතරව ශ්‍රී ලංකාවේ වාරි පද්ධතියහි විශ්මීය ජල තාක්ෂණය මේ අනුව දැක්වේ. ඊට නිදසුනක් ලෙසින් ධාතුසේන රාජ්‍යය සමයෙහි කලාවැව සිට අනුරාධපුරය නගරය ආසන්නයේ ඇති තිසාවැවට ජලය සැපයු යෝධ ඇළ පද්ධතිය වේ. වංගු නිර්මාණය තුළින් උස් භූමියෙන්-පහත් භූමීන් සදහා ජලය සැතපුමට අඟලක් වැනි කුඩා බෑස්මකින් ද එමෙන්ම වංගු අනුව ජල පීඩනය වැඩිකරගෙන ඇත. මේ අනුව ඒ ආසන්නව සියලු පහත්බිම් වගා බිම් බවට පත්කර ඇත (අපේ වැව,2021). මෙම ජලධාරාව කුඩා කුඩා වැව්වලට එක්කර ගනිමින් අනුරාධපුර නගරය මූලික කරගනිමින් අවට විශාල ගොවිබිම් බවට සකස්කර ඇත. තවද සත්ත්වයන්ට හා අනෙක් වගාවන් සඳහා ද ජලය සපයාගෙන ඇත. එමෙන්ම කෙටි උස්බිම් හඳුනාගෙන සමෝච්ඡ රේඛාවන් හැඳිනගෙන භූමිය තුළ තද පාෂාණ (කලුගල් තලාවන්) සම්බන්ධ කරමින් විශාල බැමි-වේලි ඉදිකර ඇත. කලාවැව, නාච්චදුව, තිසාවැව, රාජාංගනය වැව, නුවරවැව, පදවිය, හුරුළු වැනි ජාලගත වැව් පද්ධති ද අමුණු ආදිය මගින් ද මහා ජලකඳක් භූතලය මත රඳවාගෙන අවශ්‍යය ජලපහසුව සපයා ගත් බවටද කිව හැකි ය. පැරණි මානවයා ජල කළමනාකරණය මගින් අවශ්‍ය ආහාර පාන ද අනෙකුත් අවශ්‍යය සියල්ලම ද ලබාගෙන ඇත.

රටේ ආර්ථිකයට ද මෙම අතිරේක ජලකළමනාකරණ තාක්ෂණය 100%ක් ම සාර්ථක ලෙසින් දායකකරගෙන ඇත. ඒ සඳහා විවිධ නිළයන් ද නඩත්තුවට හා කළමනාකරණයට පත්කර ඇති බවට සාධක පුරාවිද්‍යා මූලාශ්‍රගත තොරතුරු මගින් අනාවරණය කරයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ලොව මවිත කළ අපේ වාරි ශිෂ්ටාචාරය,***අපේ වැව***, (2021) [www.youtube.com/watch?v=ZMD-FfeMjAg](www.youtube.com/watch?v=ZMD-FfeMjAg), Accessed 2023/06/20. කරුණාරත්න කිරිමැටියාව, වයස 62, 2023/06/12.